වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயல்திறன் அறிக்கை

Annual Performance Report

2021



කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்

Department of Technical Education & Training

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

අන්තර්ගතය පිටු අංකය:

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/විධායක සාරාංශය	2 - 7
02 පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම	8 - 12
03 වන පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය	13 - 27
04 වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක	28
05-පරිච්ඡේදය තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම...	29 - 30
06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	31 - 32
07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	33 - 38

1 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ආරම්භ වූයේ වර්ෂ 1893 දී රජය විසින් ආරම්භ කරන ලද ප්‍රථම කාර්මික පාසල වන කොළඹ මරදාන කාර්මික විද්‍යාලය ප්‍රතිසංස්කරණය කරන ලද කෝපි ගබඩවක ආරම්භ කිරීමත් සමඟය. මේ වන විට වසර 128 ක සේවා කාලයක් සාර්ථකව සම්පූර්ණ කර ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකා අධ්‍යාපන පනත යටතේ ක්‍රියාත්මක වූ කාර්මික පාසල් ජාලයක් දිවයින පුරා පිහිටුවීමෙන් පසුව ආරම්භ වූ කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) 1994 දී 1 ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස උසස් කරන ලදී. වර්තමානයේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා තාක්ෂණ විද්‍යාල 09ක් සහ කාර්මික විද්‍යාල 30ක් පිහිටුවා ඇත. දිවයින පුරා පිහිටා ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාල ජාලය මගින් තරුණ තරුණියන්හට නවීන කාර්මික හා තාක්ෂණික පුහුණුවක් ලබා දෙමින් දේශීය හා විදේශීය රැකියා වෙළඳපලේ විවිධ ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා මංපෙත් විවරකර දෙනු ලබයි. මෙම විද්‍යාල 39 තුළම NVQ සහ සහතික පත්‍ර යන මට්ටම්වල පාඨමාලා සියයකට වැඩි ප්‍රමාණයක් විවිධ කර්මාන්ත අංශ 17 ක් යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

සියළුම කාර්මික විද්‍යාල මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 3/4 සහ NVQ නොවන සහතිකපත්‍ර පාඨමාලා පවත්වයි. සුදුසුකම් ලත් සිසුන්ට දිවයිනේ පළාත් 9 ක පිහිටි තාක්ෂණ විද්‍යාල මඟින් NVQ 5 සහ 6 මට්ටමේ ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා හැදෑරිය හැකිය. රටේ රැකියා සුදුසුකම් ක්‍රියාවලිය හරහා පුහුණුලාභීන්ට ඔවුන්ගේ නිපුණතා නුපුහුණු මට්ටමේ සිට ප්‍රවීන ශිල්පී මට්ටම දක්වා උසස් කිරීමට උපකාරී වේ.එසේම ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමාධාරීන්ට NVQ මට්ටම 7 සඳහා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයට (UNIVOTEC) ඇතුළු විය හැකි අතර, එමඟින් සිසුන්ට තාක්ෂණවේදී උපාධියක් හෝ අධ්‍යාපන තාක්ෂණ උපාධියක් ලබා ගැනීමට ඉඩ සැලසේ.

ඔටෝමොබයිල් තාක්ෂණය, ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය, ආහාර තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, මෙකාට්‍රොනික්ස් තාක්ෂණය, ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය, විදුලි සංදේශන තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය, වෙල්ඩින් තාක්ෂණය සහ නිෂ්පාදනය ඇතුළු තාක්ෂණික පාඨමාලා පවත්වයි. තත්ත්ව සහතික පද්ධතියක් යටතේ අඛණ්ඩ පුහුණු ක්‍රමවේදය සහ ඇගයීම් හරහා මෙම පාඨමාලා තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් ප්‍රතිනතය කර ඇත.

වෙළෙඳපොල අවශ්‍යතාවයන්ට අනුව රැකියා අවශ්‍යතා සපුරාලීම සඳහා නව රැකියා ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සඳහා වරින් වර විෂයමාලා සකස් කරනු ලබන අතර පවතින විෂයමාලා නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි අඛණ්ඩව සංශෝධනය කෙරේ. රටේ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගනිමින් කර්මාන්ත ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන සුදුසුකම් ලත් ශිල්පියකු බිහි කිරීමට දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කාර්මික විද්‍යාල පද්ධතිය ඉමහත් දායකත්වයක් ලබා දේ.

2.ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජාත්‍යන්තරව උසස් පිළිගැනීමකින් යුත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

අපගේ සේවාලාභීන්ට උසස් තත්වයෙන් යුත් දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන ආයතනය ලෙස කටයුතු කිරීම.

අරමුණු

- පාසල් හැර යන තරුණ තරුණියන්ට සහ රැකියාවල නියුතු පුද්ගලයන්ට තාක්ෂණික අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම
- තාක්ෂණ හා කාර්මික අධ්‍යාපනය තුළින් උපාධි මට්ටමට ළඟා වීමට මාර්ගයක් නිර්මාණය කිරීම.
- රටේ ආර්ථික සංවර්ධනය සඳහා මානව ප්‍රාග්ධනය සැපයීම.
- ස්වයං රැකියා සහ කර්මාන්ත අංශයට මඟ පෙන්වන නිපුණතා සැපයීම.
- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන හා තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන්ගට කාර්මික අධ්‍යාපන අවස්ථා සලසා දීම.

3. කාර්යයන්

• කාර්මික අධ්‍යාපනය හා ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මඟ පෙන්වීම, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.


• කාර්මික අධ්‍යාපනය සහ පුහුණු කිරීම වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය.

• කාර්මික අධ්‍යාපනය හා පුහුණු ක්‍රමය තුල අනුමත ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට අනුව පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

• වෘත්තීය මාර්ගෝපදේශනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ සමග ඒකාබද්ධ ක්‍රියාකාරී වැඩසටහන් සැකසීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.

• කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු සිදු කිරීම, නව නිපැයුම් සඳහා අවකාශ සලසා දීම.

1.4 දෙපාර්තමේන්තුවේ ආයතනික ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති අංශයන්

- පරිපාලන අංශය
- අධ්‍යයන අංශය
- පරීක්ෂණ සහ ඇගයීම් අංශය
- වෘත්තීය මාර්ගෝපදේශන සහ අලෙවි අංශය
- යටිතල පහසුකම් සංවර්ධන අංශය
- නඩත්තු අංශය
- කළමනාකරණ තොරතුරු ඒකකය
- සැලසුම් අංශය
- තාක්ෂණික සහායක සේවා අංශය
- පර්යේෂණ සහ සංවර්ධන අංශය
- මූල්‍ය කළමනාකරණ අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන (ඇමුණුම 1)

තාක්ෂණ විද්‍යාල	-	09
කාර්මික විද්‍යාල	-	30

1.7 දෙපාර්තමේන්තුවට ලැබෙන අරමුදල්

අරමුදල් භාවිතයේ ප්‍රගතිය - 2021

අරමුදල් මූලාශ්‍රය	**2021** සඳහා අරමුදල් වෙන් කිරීම රු.මී	**2021.12.31** දිනට වියදම් රු.මී	වියදම **2021.12.31**	ප්‍රගතිය %	
ඒකාබද්ධ අරමුදල				මූල්‍ය	භෞතික
ප්‍රාග්ධන	542.70	349.86	277.49	80	95
පුනරාවර්තන	2387.40		1808.23	85	100
නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය (SSDP)	8.50		7.42	87	90
භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	76.15		48.12	63	80
	100.73		37.58		
මුළු එකතුව	**3115.20**		**2178.86**		


1.7.1 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

ඇමෙරිකානු ඩොලර් මිලියන 4 ක කොරියානු රජයේ ආධාර මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලාවල ධාරිතා වර්ධනය සඳහා වන ව්‍යාපෘතිය (2021-2024) මරදාන, රත්නපුර, තාක්ෂණ විද්‍යාල හා රත්මලාන,මාතර කාර්මික විද්‍යාල වල ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. මූලික සමීක්ෂණ කටයුතු කොරියානු නියෝජිත කණ්ඩායම විසින් අවසන් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාලව වන ගිවිසුම (Record of Discussion) සඳහා කොරියානු හා ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීමෙන් අත්සන් කිරීමේ කටයුතු සිදු කර ඇත.

ඇමුණුම 1

තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල වල පිහිටීම

පළාත	තාක්ෂණ/කාර්මික විද්‍යාලය
බස්නාහිර	ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය කොළඹ (මරදාන)
	කාර්මික විද්‍යාලය - ගම්පහ
	කාර්මික විද්‍යාලය - හෝමාගම
	කාර්මික විද්‍යාලය - කළුතර
	කාර්මික විද්‍යාලය - රත්මලාන
දකුණ	තාක්ෂණ විද්‍යාලය - ගාල්ල
	කාර්මික විද්‍යාලය - බලපිටිය
	කාර්මික විද්‍යාලය - බෙලිඅත්ත
	කාර්මික විද්‍යාලය - මාතර
	කාර්මික විද්‍යාලය - වීරවිල
සබරගමුව	තාක්ෂණ විද්‍යාලය - රත්නපුර
	කාර්මික විද්‍යාලය - ඇඹිලිපිටිය
	කාර්මික විද්‍යාලය - කෑගල්ල
	කාර්මික විද්‍යාලය - වරකාපොල
ඌව	තාක්ෂණ විද්‍යාලය - බදුල්ල
	කාර්මික විද්‍යාලය - බණ්ඩාරවෙල
	කාර්මික විද්‍යාලය - මැදගම
	කාර්මික විද්‍යාලය - මොණරාගල
නැගෙනහිර	තාක්ෂණ විද්‍යාලය - අම්පාර
	කාර්මික විද්‍යාලය - අක්කරපත්තුව
	කාර්මික විද්‍යාලය - මඩකලපුව
	කාර්මික විද්‍යාලය - දෙහිඅත්තකණ්ඩිය
	කාර්මික විද්‍යාලය - සමන්තුරේ
	කාර්මික විද්‍යාලය - ත්‍රිකුණාමලය
මධ්‍යම	තාක්ෂණ විද්‍යාලය - මහනුවර
	කාර්මික විද්‍යාලය - දඹුල්ල
	කාර්මික විද්‍යාලය - හසලක
	කාර්මික විද්‍යාලය - මාතලේ
	කාර්මික විද්‍යාලය - නුවරඑළිය
	කාර්මික විද්‍යාලය - පාතදුම්බර
උතුරු මැද	තාක්ෂණ විද්‍යාලය - අනුරාධපුර
	කාර්මික විද්‍යාලය - ප්ලොන්නරුව
වයඹ	තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල
	කාර්මික විද්‍යාලය - ආණමඩුව
	කාර්මික විද්‍යාලය - කුලියාපිටිය
	කාර්මික විද්‍යාලය - වාරියපොල
උතුරු	තාක්ෂණ විද්‍යාලය - යාපනය
	කාර්මික විද්‍යාලය - වවුනියාව
	කාර්මික විද්‍යාලය - මන්නාරම



2 වන පරිච්ඡේදය
ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 ප්‍රගතිය සහ ජයග්‍රහණ

කර්මාන්ත අංශයේ ක්ෂේත්‍ර 17ක් යටතේ පවත්වනලද පාඨමාලා 121ක් සඳහා තාක්ෂණ විද්‍යාල 09 සහ කාර්මික විද්‍යාල 30 සඳහා 2021 දෙසැම්බර් 31 වන විට සිසුන් 25,750ක් බඳවාගෙන ඇත. පෙර වසරවල බඳවාගත් සිසුන් 10,037 ක් සමඟ 2021 දී විද්‍යාල 39 හි සිසුන් 35,787 ක් පුහුණුව ලබා ඇත. පුහුණුව ලැබූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 41% ක ප්‍රතිශතයක් කාන්තාවන් නියෝජනය කර ඇත.

#	ක්ෂේත්‍රයේ නම	2021 වර්ෂයේ සිසුන් ඇතුලත් කිරීම	පෙර වසරවල සිසුන් බඳවා ගැනීම	13 වසර වැඩසටහන යටතේ බඳවා ගැනීම්	මුළු ශිෂ්‍ය බඳවාගැනීම්
1	කෘෂිකාර්මික වැවිලි සහ පශු සම්පත්	1521	553	68	2074
2	මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව	2785	1383	454	4168
3	ගොඩනැගිලි ඉදිකිරීම	8009	4053	65	12062
4	විදුලි, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ	2283	1441	95	3724
5	මූල්‍ය බැංකුකරණය සහ කළමනාකරණය	1782	491		2273
6	ආහාර තාක්ෂණය	154	96		250
7	මැණික් සහ ස්වර්ණාභරණ	43	4		47
8	හෝටල් සහ සංචාරක	129		7	129
9	තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය තාක්ෂණය	3630	806	149	4436
10	භාෂා	2291	12		2303
11	සම් භාණ්ඩ සහ පාවහන්	22			22
12	මෙකාට්‍රොනික් තාක්ෂණය	292	197		489
13	ලෝහ සහ සැහැල්ලු ඉංජිනේරු විද්‍යාව	814	90	5	904
14	කාර්යාල කළමනාකරණය	987			987
15	ශීතකරණ සහ වායු සමීකරණය	719	40	32	759
16	රෙදිපිළි සහ ඇඟලුම්	196	65		261
17	දැව කර්මාන්තය	93			93
	මුළු එකතුව	**25750**	**10037**	**1024**	**35787**

• Covid 19 වසංගත තත්වය හේතුවෙන් බලපෑමට පත් වූ කාලසීමාව තුළ විද්‍යාල 39හිම ඉගෙනීම කටයුතු මාර්ගගතව පුහුණු වැඩසටහන් හරහා අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර වැඩසටහන් 1130ක් සඳහා සිසුන් 14,197ක් සහභාගී විය.

• වසර 13 ක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ 2021 වසර සඳහා සිසුන් 1024 දෙනෙකු විවිධ වෘත්තීය ක්ෂේත්‍ර යටතේ පුහුණු කරන ලදී.

• පාඨමාලා සාර්ථකව නිම කළ පුහුණුලාභීන් සඳහා NVQ සහතික 3655ක් සහ NVQ නොවන සහතිකපත් සහ දෙපාර්තමේන්තුව මඟින් නිකුත්කරන ලද සහතිකපත් 16,134ක් ඇතුළුව සහතික 19,789ක් නිකුත් කර ඇත.

• 2021 අයවැය යෝජනාව යටතේ ක්‍රියාත්මක කරන ලද ''නිපුණතා සිසු සවිය'' ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ විශේෂිත කර්මාන්ත පාඨමාලා සඳහා බඳවාගත් සිසුන් සඳහා රුපියල් මිලියන 27.8 (මසකට රු. 4000) ගෙවීම සිදු කරන ලදී. ඊට අමතරව ශිෂ්‍ය සුබසාධන යෝජනා ක්‍රමය යටතේ ශිෂ්‍යාධාර, වාර ප්‍රවේශපත්‍ර හා දෛනික පැමිණීමේ දීමනාව සඳහා රුපියල් මිලියන 25.796 ක් වැය කරන ලදී.

• නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු. මි 1.45 ක අරමුදල් යොදාගෙන කුරුණෑගල තාක්ෂණ විද්‍යාලයේ මෝටර්රථ වර්ණ සංයෝජන කාර්මික ශිල්පී නව පාඨමාලාවක් ආරම්භ කර ඇත. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුමට අනුව වර්ණ මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් ලබා දීම සඳහා Akzonobel වර්ණ සමාගම අනුග්‍රහය දක්වා ඇති අතර, ඉහළ වැටුප් සහිත රැකියා අවස්ථා ලබා ගත හැකි සිසුන් 20 දෙනෙකු පුහුණු කිරීම සඳහා පූර්ණ පහසුකම් සහිත පුහුණු ඒකකයක් ස්ථාපිත කර ඇත.

• පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රදේශයේ නව පරිශ්‍රයක අළුතින් ඉදිකරන ලද කාර්මික විද්‍යාලය 2021 පෙබරවාරි 11 වන දින සිසු අයිතියට පත් කරන ලදී. පන්ති කාමර, වැඩහල් සඳහා තෙමහල් සහ දෙමහල් ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම සඳහා ඒකාබද්ධ අරමුදල යටතේ රුපියල් මිලියන 420 ක් වැය කරන ලදී. නවීන වැඩහල් ගොඩනැගිල්ල, පරිගණක විද්‍යාගාරය, පරිපාලන ඒකකය, කාර්ය මණ්ඩල නිල නිවාස සහ පානීය ජල සැපයුම ඇතුළු අනෙකුත් භෞතික යටිතල පහසුකම් සහිතව ඉදිකරන ලද කාර්මික විද්‍යාලය මඟින් කර්මාන්ත ඉල්ලුමට සරිලන පරිදි පුත්තලම දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා නව පාඨමාලා රැසක් ආරම්භ කර ඇත.

• වෘත්තීය අධ්‍යාපන ප්‍රවර්ධන කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ වැඩහල් සහ පන්ති කාමර සඳහා උපකරණ ලබා දීම මඟින් කාර්මික විද්‍යාල 14ක් සංවර්ධනය කරන ලදී. සියළුම අවිච්ඡේද ව්‍යාපෘති නිම කරන ලද අතර රු.මි.120.39ක වියදමක් දරන ලදී.

• 2021 වසරේ ක්‍රියාත්මක කරන ලද වෘත්තීය අධ්‍යාපන ප්‍රවර්ධන හා භෞතික සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ කාර්මික විද්‍යාල 15ක සහ තාක්ෂණ විද්‍යාල 2ක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 106ක් අනුමත වූ අතර, ව්‍යාපෘති 32ක් ක්‍රියාත්මක කරන ලදී.

• නව පාඨමාලා ආරම්භ කිරීමට සහ පවතින පාඨමාලා වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපකරණ ලබාදීමට රුපියල් මිලියන 57.4ක් අනුමත කරන ලදී. මේ යටතේ මෝටර් සයිකල් සහ ස්කූටර් අළුත්වැඩියා කිරීම, සූර්ය පැනල තාක්ෂණය, මෝටර් රථ විදුලි කාර්මික, ඔටෝ පින්තාරු සහ ඔටෝ ටින්කරින්, ගෘහස්ත විදුලි, වෙල්ඩින්, පරිගණක දෘඩාංග, ගොඩනැගිලි ශිල්පීන්, පෙදරේරු, ඉවුම් පිහුම් සහ බේකරි, ජලනල කාර්මික හා ලී වැඩ ඇතුළු පාඨමාලා ආරම්භ කිරීම සඳහාත් පවතින පාඨමාලා වලට අදාල වැඩහල් යාවත්කාලීන කිරීම සඳහාත් රු.මි. 48.78 ක වටිනාකමකින් යුත් උපකරණ මිලදී ගෙන ඇත.

• තාක්ෂණ විද්‍යාලවල පුහුණු ධාරිතාව උපරිම මට්ටමට ඉහළ නැංවීම සඳහා ඒකීය වාස්තු විද්‍යාත්මක සැලසුමක් තුළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2021 අයවැය යෝජනා, "ටෙක් උදාන" වැඩසටහන යටතේ කුරුණෑගල (රු.මි.200), මහනුවර (රු.මි. 205), මරදාන(රු.මි.200) තාක්ෂණ විද්‍යාල හා හෝමාගම (රු.මි.143),දඹුල්ල(රු.මි.148) සහ මාතර(රු.මි. 57.35) යන කාර්මික විද්‍යාල නවීකරණය කිරීම ආරම්භ කර ඇත. 2022 වර්ෂයේදී සියළු වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

• වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ පාඨමාලාව හදාරන සිසුන්ට ආකර්ශනීය ප්‍රායෝගික පුහුණු පරිසරයක් සඳහා පහසුකම් සැලසීම සඳහා නවීන තාක්ෂණික කෘෂි ගොවිපල ඒකකයක් ස්ථාපිත කිරීම සහ වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කරමින් පවතී.

• දැනට පවතින බේකරි සහ සූපශාස්ත්‍ර පාඨමාලාව අංග සම්පූර්ණ පහසුකම් සහිතව මුළුතැන්ගෙයි ඒකකයක් ස්ථාපිත කිරීම මගින් වැඩිදියුණු කරනු ලැබේ.

• නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රත්නපුර, ගාල්ල සහ මහනුවර කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල පවත්වනු ලබන ගෑස් සහ වාප වෙල්ඩින්, ශීතකරණ සහ වායු සමීකරණ, ආහාර තාක්ෂණ සහ කාර්මික විදුලි පාඨමාලා වැඩිදියුණු කිරීම සඳහා රු.මිලි. 3.50 ක වටිනා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගන්නා ලදී

•මරදාන, රත්නපුර තාක්ෂණ විද්‍යාල සහ රත්මලාන, මාතර යන කාර්මික විද්‍යාල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පරිගණක ආශ්‍රිත සැලසුම් තාක්ෂණය (Drafting Technology), සැලසුම් ශිල්පය (Draftsmanship) සහ කාර්මික ජලනල තාක්ෂණය (Industrial Plumbing) යන පාඨමාලා වැඩිදියුණු කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 4 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත කොරියානු රජයේ (KOICA) ප්‍රදාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ගිවිසුම (Record Of Discussion) අත්සන් කර ඇත. ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2022 වර්ෂයේ සිට ආරම්භ කෙරේ.

• වසරේ පළමු කාර්තුව තුළ ඉලක්කගත කණ්ඩායම් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ විද්‍යාල මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 84 ක් සහ ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් (SEPI) 10 ක් පවත්වන ලද අතර ඊට සමගාමීව දෙපාර්තමේන්තුව විසින් ජන මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

• වරකාපොල සහ වීරවිල යන කාර්මික විද්‍යාලවලින් හඳුනාගත් ස්වයං රැකියා යෝජකයින් දෙදෙනෙකු සඳහා ස්වයං රැකියා උපත්පාදන උපණය ක්‍රමය (SEPI) යටතේ ණය දෙකක් ලබා දෙන ලදී.

• ජාත්‍යන්තර තරුණ නිපුණතා දිනයට අදාළව, සූම් තාක්ෂණය හරහා අදාළ අංශවල විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් වෙබිනා මාලාවක් සංවිධානය කරන ලදී. ඔන්ලයින් වැඩමුළු වල පරමාර්ථය වූයේ ඇලුමිනියම් පිළිසකරකරණය , ඔටෝ ටින්කරින්, පේස්ට්‍රි සහ සත්කාරක සේවා වැනි වෘත්තීය පුහුණු පාඨමාලා ප්‍රවර්ධනය කිරීමයි.

- අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් 10ක් පවත්වන ලද අතර, රු.මිලි. 0.244. වියදමින් අධ්‍යයන කාර්ය මණ්ඩලය 106 දෙනෙකුගේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 75 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩසටහන් පවත්වා ඇත. 2021 වර්ෂයේදී Colombo Plan ආයතනය විසින් සංවිධානය කරන ලද මාර්ගගත පුහුණු වැඩසටහන් 25 ක් සඳහා දෙපාර්තමේන්තුවේ නම් කරන ලද නිලධාරීන් මෙන්ම විද්‍යාල වල නිලධාරීන් ද සහභාගී විය.

• අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා තත්ව කළමණාකරන පද්ධතිය (QMS) අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදුකරන ලද අතර, දැනටමත් විද්‍යාල 35 ක් සඳහා තත්ව වැඩිදියුණු කිරීම සඳහා තරු (QIS) සහතික ලබා ඇති අතර QIS ප්‍රමිතීන් පවත්වාගෙන යයි.

2.2 . ඉලක්ක සහ අනාගත දැක්ම 2022

- 2022 වර්ෂය සඳහා තාක්ෂණ විද්‍යාල 09 ක සහ කාර්මික විද්‍යාල 30 ක විවිධ අංශ 18ක් යටතේ පාඨමාලා 117ක් සඳහා සිසුන් 32000ක් බඳවා ගැනීමට සැලසුම් කර ඇත. මේ යටතේ NVQ 5/6 ඩිප්ලෝමා 38ක් NVQ 3/4 පාඨමාලා 74ක් ඇතුළුව විද්‍යාල 39ක වැඩසටහන් 900ක් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

- ඔන්ලයින් අධ්‍යාපන ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා, සියලුම තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල ආවරණය වන පරිදි ඉගෙනුම් ආධාරක සැපයීමට සැලසුම් කර ඇති අතර, විද්‍යුත් ඉගෙනුම් ක්‍රමවේදය තවදුරටත් ප්‍රචලිත කිරීම සඳහා මාර්ගගත අධ්‍යාපන ක්‍රමයට ගැලපෙන පරිදි සියලුම විෂය නිර්දේශ සඳහා ඉගැන්වීම් ද්‍රව්‍ය සකස් කිරීමට සැලසුම් කර ඇත.

- අධ්‍යයන සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා ශිල්ප ප්‍රදර්ශකයින් 38 දෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. 2021 වර්ෂයේ දී අයදුම්පත් කැඳවා ඇති අතර 2022 වර්ෂයේදී තරඟ විභාගය පවත්වා බඳවාගැනීම් කිරීමට සැලසුම් කර ඇත. එසේම, උපදේශක තනතුරුවල අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා පළමු අදියර යටතේ උපදේශකයින් 100 දෙනෙකු බඳවා ගැනීමටද සැලසුම් කර ඇත.

- 2022 වර්ෂයේදී පුහුණුව අවසන් කරන සිසුන් සඳහා NVQ 3/4 සහ NVQ 5/6 සහතික පත්‍ර 9500ක් සහ සහතික පත්‍ර පාඨමාලා සඳහා සහතික 12400ක් ඇතුළුව සහතික 21900ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

- උද්ගතවූ Covid 19 තත්ත්වය හේතුවෙන් වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානය පැවැත්වීමට නොහැකිවූ බැවින් බැවින් 2019 වසරේ සුදුසුකම් ලත් ඩිප්ලෝමාලාභීන් 1395 දෙනෙකු සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදාන උත්සවය 2022 වසරේ මුල් කාර්තුවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

- 2022 වසර වන විට තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල 27ක නව පාඨමාලා 20ක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා පුහුණු උපකරණ මීලදී ගැනීම වෘත්තීය අධ්‍යාපන ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව සිදු කල අතර, නව පාඨමාලා ලෙස මෝටර් පින්තාරු කිරීම (Auto Painter) , ස්වයංක්‍රීය වායුසමීකරණය, ඇලුමිනියම් පිළිවිතකරකරණය,වාහන ටින්කරින්, යතුරුපැදි සහ ස්කූටර් අළුත්වැඩියා කිරීම, සූර්ය පැනල තාක්ෂණය, වායු සහ වාප වෙල්ඩින්, බතික්, බේකරි සහ කුකරි සහ වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය ආදිය වෙළඳපොලේ ඉහළ රැකියා ඉල්ලුමක් සහිත පාඨමාලා ලෙස හඳුනාගෙන ඇත.

- 2021 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මකවූ ටෙක් උදාන සංවර්ධන වැඩසටහන යටතේ කුරුණෑගල, මහනුවර, මරදාන තාක්ෂණ විද්‍යාලය සහ හෝමාගම, දඹුල්ල සහ මාතර කාර්මික විද්‍යාල වඩාත් ආකර්ශනීය පුහුණු මධ්‍යස්ථාන බවට පත් කිරීම සඳහා ඒකීය වාස්තු විද්‍යාත්මක සැලසුමක් මත ප්‍රතිසංස්කරණය අවසන් කර උපරිම ධාරිතාව සිසුන් බඳවා ගැනීම සඳහා අපේක්ෂා කෙරේ.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලා වැඩිදියුණු කිරීම සඳහා කොරියානු රජයේ (KOICA) අරමුදල් මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රදාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම ව්‍යාපෘති කාල රාමුවට අනුව, මරදාන,රත්නපුර,රත්මලාන හා මාතර යන ප්‍රතිලාභී විද්‍යාලවල යෝජිත පාඨමාලා සඳහා භාවිතාවන වැඩහල් ප්‍රතිනිර්මාණය කර යටිතල පහසුකම් සංවර්ධන,වැඩහල් උපකරණ හා මෙවලම් සැපයීම සහ විෂයමාලා වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වේ. එසේම, සැලසුම් ශිල්පී පාඨමාලාව,පරිසණක ආශ්‍රිත සැලසුම් ශිල්පය හා කාර්මික ජලනල තාක්ෂණය යන පාඨමාලා සඳහා ගුරුඅත්පොත් සකස් කර ගුරුවරුන් පුහුණු කිරීම හා රැකියාගත පුහුණු උපායමාර්ගයක් සකස් කිරීම යන ව්‍යාපෘති සංරචක ක්‍රියාත්මක කිරීම කොරියානු විශේෂඥ කණ්ඩායම මඟින් සිදු කරනු ලැබේ.

- මරදාන, රත්නපුර, රත්මලාන සහ මාතර යන විද්‍යාලවල ක්‍රියාත්මක KOICA අරමුදල් ව්‍යාපෘතිය හරහා පරිගණක ආශ්‍රිත සැලසුම් තාක්ෂණය, සැලසුම් ශිල්පය සහ කාර්මික ජලනල තාක්ෂණ වැඩහල් වැඩිදියුණු කරන ලද පහසුකම් සමඟ උපරිම පුහුණු ධාරිතාවයකින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

- 2022 අයවැය යෝජනා යටතේ ප්‍රමුඛතා පදනම මත තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මේ යටතේ කුලියාපිටිය, රත්මලාන, බදුල්ල, ඇඹිලිපිටිය සහ යාපනය යන විද්‍යාල නවීන පහසුකම් සහිතව ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කෙරේ.


- හෝටල් හා සංචාර ක්ෂේත්‍රයේ පාඨමාලා පුළුල් කිරීමේ අරමුණින් (Pizza Hut) පීසා හට් සමාජ සත්කාරක අරමුදල් ආශ්‍රිතව හඳුනාගත් විද්‍යාල වල පාඨමාලා ආරම්භ කිරීමටත් විදුලි ක්ෂේත්‍රයේ පාඨමාලා යාවත්කාලීන කිරීම සඳහා ජර්මානු රජයේ GIZ අරමුදල් මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර ඇත.

- කාර්මික විද්‍යාල මඟින් පිරිනමනු ලබන NVQ 4 මට්ටමේ පාඨමාලා සඳහා වැඩි සිසුන් පිරිසක් ආකර්ෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් හරහා සමාජ මාධ්‍ය ප්‍රවර්ධනය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

3 වන පරිච්ඡේදය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය




ඒසිඒ-එක්

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2021		සටහන	තක්ෂ 2021	2020	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අයිමි		1,920,750,000	1,981,640,000	ඒසිඒ-3
-	නැන්පතු		263,046,547	187,392,586	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		50,910,534	32,568,117	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**2,234,707,081**	**2,201,600,703**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**2,234,707,081**	**2,201,600,703**	
	භාණ්ඩාගාරෙ ජේෂණ (ඇ)				
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) -(ඈ)		**2,234,707,081**	**2,201,600,703**	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,992,500,000.00	වැටුප්, වෙනස සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,579,526,764	1,675,608,197	
285,150,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	195,286,927	221,711,420	ඒසිඒ-2(ii)
109,750,000.00	ඝනනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	34,095,848	85,312,200	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	424,883	
2,387,400,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,808,909,539**	**1,983,056,700**	
	මූලධන වියදම්				
182,200,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	99,843,846	23,512,989	
338,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	170,242,765	129,693,700	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
22,500,000.00	හැකියා වර්ධනය	14	7,397,809	2,368,806	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
542,700,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**277,484,420**	**155,575,495**	
	නැන්පතු ගෙවීම්		216,595,373	189,331,855	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		53,324,104	28,289,056	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		269,919,477	217,620,911	
	මුළු වියදම් එ = (ඊ +උ +ඌ)		2,356,313,436	2,356,253,106	
2,930,100,000.00	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ - එ)**		**(121,606,354)**	**(154,652,403)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(121,606,356)**	**(154,652,403)**	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-පී

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2021/12/31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021	2020
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	8,488,861,066	6,387,040,128
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	113,827,039	111,413,468
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**8,602,688,105**	**6,498,453,596**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		5,113,086	49,150,689
දේපළ පිරියත හා උපකරණ සංචිතය		8,488,861,066	6,387,040,128
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	108,713,953	62,262,779
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**8,602,688,105**	**6,498,453,596**

පිටු අංක 07 සිට 65 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 66 සිට 107 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, රීට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුල පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.


ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මූදල්)/ කොමසාරිස් (මූදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2022. 02. 25	දිනය : 2022. 02. 25	දිනය : 2022. 02. 28

ඒස්. සී. ජගත්
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුනුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ. පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ-10.

බී.ඒ.පී.පී. චිත්‍රානන්ද බමුණුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත, කොළඹ 10.

ලේකම්
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය




ඒසිඒ-සී

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර ලාභ		
ආදායම් නොවන ලැබීම්	123,257,357	126,113,816
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්		
අග්‍රිම ලැබීම්	1,920,750,000	1,981,640,000
අත්තිකාරම් අය කර ගැනීම්	52,018,908	40,635,930
තැන්පතු ලැබීම්	263,046,547	187,392,586
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,359,072,812**	**2,335,782,332**
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,774,167,996	1,870,243,495
සහනාධාර සහ මාරුකිරීම්	34,095,848	85,737,083
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	3,638,532	6,840,252
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		-
අත්තිකාරම් ගෙවීම්	53,090,642	28,054,152
තැන්පතු ගෙවීම්	216,595,373	189,331,855
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,081,588,391**	**2,180,206,837**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**277,484,421**	**155,575,495**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	277,484,421	155,575,495
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූල මුදල් ප්‍රවාහය (ඉ)	**277,484,421**	**155,575,495**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(277,484,421)**	**(155,575,495)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූල මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූල මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අනාහාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විතවේ.

7)

මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂය සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම්.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදු කරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාල ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාල නැත.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගීකර ගැනීමේ කාර්යසාධනය

වියදම් ශීර්ෂ	මුළු ඇස්තමේන්තු පිරිවැය	ප්‍රතිපාදන (රු.මිලි)	වියදම 2021 දෙසැම්බර් 31 දක්වා (රු.මිලි)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
ප්‍රාග්ධන	**542.700**	**358.335**	**277.491**	**77%**	**80%**
ගොඩනැගිලි හා ඉදිකිරීම්	310.000	221.911	185.315	84%	85%
යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම	83.000	83.000	56.821	68%	70%
ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම	40.000	26.670	15.532	58%	65%
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව	16.000	11.940	8.034	67%	70%
වාහන අළුත්වැඩියාව	6.200	4.633	4.392	95%	96%
මානව සම්පත් සංවර්ධනය	22.500	10.181	7.397	73%	75%
කල් බදු ක්‍රමයට වාහන මිලදී ගැනීම	65.000	0.000	0.000		
පුනරාවර්තන		**2387.40**	**1808.23**	**85%**	**100%**


3.7 මු.රෙ. 208 ප්‍රකාරව,වෙනත් දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රධානය කරනලද ප්‍රතිලාභ

අදාල නැත.

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

අදාල නැත.

3.9 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. VOT/E/DTET/2021/FA/18

මෙම අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ජූනි 22 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } VOT/E/DTET/2021/FA/18 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජූනි 22 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මූල්‍ය ප්‍රවාහය පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතයවේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 1.6.1.1 හා 1.6.2.1 ඡේදවල සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) 3.1 (අ) ඡේදයේ සඳහන් කරුණ හැර ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආරම්භක ශේෂ වල වෙනස්කම් පැවතීම.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පෙර වර්ෂයේ මුදලින් පියවන ලද අත්තිකාරම් ලැබීම්වල එකතුව ඇතුලත්කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ 2020 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇති වටිනාකම හා පසුගිය වර්ෂයේ අත්තිකාරම් ගිණුම අනුව එම වටිනාකම් අතර රු. 1,326,759 ක වෙනසක් පැවතුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 ආරම්භක ශේෂ වල වෙනස්කම් පැවතීම.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් සැසඳීමේදී හරස් සටහන්හි ශේෂය අත්තිකාරම් ගිණුම් ශේෂය තුල ඇතුලත් නොකිරීම නිසා අත්තිකාරම් ගිණුමේ රු. 6,975,956 ක වෙනසක් හා භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් වල රු. 6,975,956 ක වෙනසක් පැවතුණි.

1.6.2.2 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනයේ ශේෂ හා 2021 ජනවාරි 01 දිනට එම ප්‍රකාශනයේ ආරම්භක ශේෂ සමඟ සැසඳීමේදී 2020 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල නමුත් සිගාය් පරිගණක මුද්‍රිත සටහනෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ 2020 වර්ෂයට සටහන් නොවී තිබීමත් , හදුනාගත් වැරදි සටහන් පැවතීමත් හේතුවෙන් වත්කම් වර්ග 8 ක රු.1,230,892,660 ක වෙනසක් පැවතුණි.

1.6.2.3 තැන්පතු ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුම් 03 හි සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 2 ඉක්මවූ රු 23,511,236 ක තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට බැරකල යුතු 2015-2018 කාලපරිච්ඡේදයට අදාලව රු.54,680 ක මුදලක් අදාල අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන පැවතුණි.

(ඇ) නිකුත් කල නමුත් මාස 06 කට වඩා වැඩි කාලයක් තුළ ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ වටිනාකම රු. 1,099.174 ක වෙක්පත් 03 ක් 2015 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

(ඈ) 2018 ජනවාරි සිට හඳුනා නොගත් ලැබීම් අවස්ථා 5 කට අදාල එකතුව රු.232,560 ක් හා 2019 දෙසැම්බර් සිට බැංකු ගත කල නමුත් නිශ්කාෂණය නොවූ රු. 29,800 ක් වටිනා වෙක්පත් 02 ක් පොදු තැම්පත් ගිණුමට මාරු කර තිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 110 ප්‍රකාරව සකස් කරන ලද හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ප්‍රතිපාදන ඉතිරිවීම

දෙපාර්තමේන්තුව විසින් සියයට 50ට වැඩි ප්‍රතිපාදන ඉතුරු කල අවස්ථා 22 ක් වූ අතර එම වටිනාකම රු 196,851,945 ක් විය.

2.2 බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 214 ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාලපරිච්ඡේදයේ පැවති අවස්ථා 39 කට අදාල රු. 5,555,206 ක බැරකම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ වැය විෂයයන් 26 ක දැක්වෙන ශේෂ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ (එස් ඒ 92) දැක්වෙන ශේෂ සමඟ සැසඳීමේදී රු. 60 සිට රු.5,385,472 දක්වා පරාසයක වෙනස්කම් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 04 ක ඉතිරිය ඉක්මවා රු. 6,205,441 ක බැරකම් වලට බැඳී තිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	
(i) 3.1 වගන්තිය	ප්‍රධාන කාර්යාලය සතුව වාහන 13 ක් සහ තාක්ෂණික/කාර්මික විද්‍යාල 17 ක පවතින වාහන 20 ක් සඳහා චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.
(ii) 5.1 වගන්තිය	වාහන ලොග් පොත් තුළ මාසික ධාවන සාරාංශ යාවත්කාලීන නොකල අවස්ථා 16 ක් පැවතුණි.

2.4 අවධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2017 වර්ෂයේ ජපානයේ පැවති කාර්මික පුහුණු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා සහභාගි වීමට හැකියාව නොමැති නිලධාරියෙකුට විදේශගත වීමෙන් සිදු කල වරදට හා මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා නිලධාරියෙකු තෝරා ගැනීමේදී ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 4 වන වගන්තිය උල්ලංඝනය වන අයුරින් වැරදි සහගත ලෙස නිලධාරියෙකු තෝරා යැවීමට කටයුතු කිරීම , රාජ්‍ය මුදල් අයතා ලෙස පරිහරණය කිරීමට ඉඩ හැරීම සහ නොසැලකිලිමත් ලෙස රාජ්‍ය සේවය අපකීර්තිමත් වන අයුරින් කටයුතු කිරීම සම්බන්ධයෙන් එවකට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) හා කළමණාකරණ සේවා නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14 වගන්තිය ප්‍රකාරව චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට 2018 නොවැම්බර් 24 දිනැති මූලික විමර්ෂණ වාර්තාවේ නිර්දේශ කර තිබුණද 2022 මැයි 22 වන විටත් එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.5 අත්තිකාරම් බී ගිණුම

රජයේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා පලාත් පාලන ආයතනවලට මාරු වී ගිය නිලධාරීන් හා මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල සේවය අතහැර ගොස් ඇති, සේවය අවසන් කල නිලධාරීන් 81 කගෙන් අයවිය යුතු එකතුව රු. 4,443,564 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 **බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ට වැඩි චෙක්පත් හි එකතුව රු 144,200 ක් වුවත් මුල්‍ය ප්‍රකාශනයෙහි සටහන (viii) හි එම වටිනාකම රු 125,800 ක් ලෙස එනම් රු 18,400 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ආ) ලංකා බැංකු ආණමඩුව ශාඛාවේ ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම අනුව මාස 06 ඉක්ම වූ ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු. 249,862 ක් වුවද මුල්‍ය ප්‍රකාශනයෙහි සටහන (viii) අනුව ඉදිරිපත් නොවූ චෙක්පත් යටතේ ශේෂයක් සඳහන්ව නොපැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 (ඇ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යාලය හා තාක්ෂණ / කාර්මික විද්‍යාල 15 ක නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ රු. 646,390 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් අවශ්‍යය කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාලයට අයත් ගිණුමට අදාල බැංකු සැසඳුමේ මාස 06 ක කාලයක් ඉක්මවූ උපලබ්ධි නොවූ තැන්පතු ලෙස රු.349,060 ක් වටිනා චෙක්පත් දෙකක් පැවතීමත් 2021 ජනවාරී 01 සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ එකතුව රු. 8,980,552 ක් වූ හඳුනා නොගත් ලැබීම් හඳුනා ගැනීමට කටයුතු කිරීමක් සිදුව නොතිබුණි.

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල නිර්දේශ කර තිබූ අපහරණය කල යුතු වත්කම් වර්ග 2922 ක හා විකිණීම සඳහා නිර්දේශ කර තිබූ වත්කම් වර්ග 5432 ක වටිනාකම් හඳුනාගෙන පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තාක්ෂණ හා කාර්මික විද්‍යාල 06 ක නිල නිවාස 16 ක් උපයෝජනයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 හා 881 (i) ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා කාර්මික/තාක්ෂණ විද්‍යාල වල ඇප ලබා ගත යුතු නිලධාරීන් එම තනතුරට පත්කල දින සිට මාස 2 ක් ඇතුලත ඇප ලබාගත යුතු වුවත් කිසිදු නිලධාරියෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි.

3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛනයේ පවතින කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල සිදු වූ දේපල හානි 08 ක සහ වාහන අනතුරු 03 ක එකතු වටිනාකම වන රු 172,063 ක් මූල්‍ය ප්‍රකාශනවල පොත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ආ) හානි ලේඛනයේ සටහන් කර ඇති අවස්ථා 12 කදී සිදු වී ඇති වාහන අනතුරු සම්බන්ධයෙන් වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයේ පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට පැවත එන රු. 4,510,469 ක් වටිනා හානි පාඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 103(1) ප්‍රකාරව කටයුතු නොකර අවුරුදු 2 ත් අවුරුදු 10 ත් අතර කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරියට ගෙන එමින් පැවතුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 -2019 කාලය අතරතුරදී රිය අනතුරු 05 කදී සිදු වූ අලාභයෙන්, රක්ෂණ වන්දි නොලද එකතු වටිනාකම රු. 208,416 ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව අනුව වගකිව යුතු පාර්ශවයන් වෙතින් අය කරගත යුතු බව නිර්දේශ කර තිබුණද එම මුදල අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ / කාර්මික විද්‍යාල 39 න් විද්‍යාල 15 ක පිහිටි ඉඩම් වල අයිතිය අදාල විද්‍යාල වෙත හෝ දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන්ගේ, දෙපාර්තමේන්තු ගත තනතුරු දරන නිලධාරීන්ගේ හා ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ චාර්ෂික ස්ථාන මාරු පරිපාටි විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් විද්‍යාල 09 ක තොරතුරු අනුව නිලධාරීන් 186 දෙනෙකු එකම සේවා ස්ථානයේ රැඳී සිටින බව නිරීක්ෂණය විය.

(ඈ) පාඨමාලාවන් පැවැත්වීම සම්බන්ධ ගැටළු.

(i) 2017 -2019 වර්ෂයන් වලදී හසලක හා හෝමාගම කාර්මික විද්‍යාලයන්හි ආරම්භ කිරීමට සැළසුම් කර තිබූ පාඨමාලා 10 ක් සඳහා ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති වීම හා බාහිර උපදේශකවරුන් අදාල සුදුසුකම් සපුරා නොමැති වීම හේතුවෙන් පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

(ii) පාඨමාලාවන්ගේ ගුණාත්මකභාවය හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික උපකරණ හා මෙවලම් වර්ග 19 ක් ප්‍රමාණවත් පරිදි අවශ්‍ය වුවද විද්‍යාල 6 ක පහසුකම් ප්‍රමාණවත් පරිදි නොපැවතුණි.

(iii) පාඨමාලාවන් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් පන්ති කාමර පහසුකම් අවශ්‍ය වුව ද කාර්මික / තක්ෂණ විද්‍යාල 07 ක පවතින පන්ති කාමර පහසුකම් ප්‍රමාණවත් නොවන තත්වයක පැවතුණි.

(iv) නුවරඑළිය කාර්මික විද්‍යාලයේ ද්‍රවිඩ මාධ්‍ය පාඨමාලාවලට වැඩි ඉල්ලුමක් පැවතියද එම මාධ්‍යයෙන් පැවැත්වන පාඨමාලා සඳහා ගුරු හිඟයක් පවතින බවද ප්‍රදේශයට ගැලපෙන පරිදි කෘෂි,සත්ව වැනි නව පාඨමාලා ආරම්භ කිරීමට විද්‍යාලය සතු භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන තත්වයක පැවතුණි.

(ඉ) මුදල් නිකුත් කිරීම සඳහා වූ නිර්ණායකයන් පදනම්ව සකස්කරන ලද කාර්යසාධන නිර්ණායක මත ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් නව දෙනෙකුට රු. 1,095,994 ක දීමනාවක් ගෙවා තිබුණ ද ව්‍යාපෘතියේ ප්‍රමුඛ කාර්යයන් කිහිපයක් වන පුහුණුකරුවන්ගේ වෘත්තීමය හැකියාවන් සංවර්ධනය කිරීම , ගුණාත්මක බවින් යුත් කාර්මික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් ඉහල නැංවීම, නව පාඨමාලා හඳුන්වා දීම හෝ සංශෝධනය කිරීම, වෘත්තීමය ගුරුවරුන්ගේ අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කිරීම, කාර්මික විද්‍යාලවලට අවශ්‍ය උපකරණ සැපයීම සහ යටිතල පහසුකම් පද්ධතිය වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණ / කාර්මික විද්‍යාල 16 ක් සඳහා කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා ලේඛකාධිකාරිවරයකු අනුමතව සිටියද ඒ සඳහා කිසිදු කථිකාචාර්යවරයකු හෝ ලේඛකාධිකාරිවරයකු අනුයුක්තව නොතිබුණි.

(ආ) සියලුම විද්‍යාලයන් සඳහා ශිල්ප ප්‍රදර්ශකවරුන් එක් අයෙකු බැගින් 39 දෙනෙකු අනුමතව සිටියද ගාල්ල හා වරකාපොළ විද්‍යාලවල පමණක් සත්‍ය වශයෙන් සේවයේ යොදවා තිබුණි.

ඩබ්ලිව්.එම්.පී.ඒ. පොන්සේකා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

4 වන පරිච්ඡේදය

ආයතනයේ කාර්යසාධන දර්ශක

අනු අංකය	විශේෂිත දර්ශකය	දර්ශකය ගණනය කිරීම	සැබෑ ප්‍රතිඵලය අපේක්ෂිත ප්‍රතිඵලයේ ප්‍රතිශතයක් (%) ලෙස			විශේෂ කරුණු
			100% -90%	75%-89	50%- 74%	
1.	පාඨමාලා සම්පූර්ණ කරන ප්‍රතිශතය	පාඨමාලා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව X 100 බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව		√		
2.	පුහුණු ධාරිතා උපයෝජන ප්‍රතිශතය	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100 බඳවාගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව	√			
3.	ශිෂ්‍ය බඳවාගැනීමේ ප්‍රතිශතය	බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100 ලැබූ මුළු අයදුම්පත් සංඛ්‍යාව		√		ලැබුනු අයදුම් පත් සංඛ්‍යාවෙන් 70% පමණ ඇතුලත් කරගෙන ඇත
4.	ඒකක පුහුණු පිරිවැය (රු)	වාර්ෂික මුළු පුනරාවර්තන පිරිවැය X 100 වර්ෂයට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව		Rs. 44,080.00		
5.	රැකියාගතවීමේ ප්‍රතිශතය	රැකියාගත සංඛ්‍යාව X 100 පාඨමාලා සම්පූර්ණ කල සංඛ්‍යාව			√	
6.	මුළු වියදම් සඳහා ආදායම් උත්පාදිත අරමුදල්	පාඨමාලා ගාස්තු ලෙස අයකල මුදල් ප්‍රමාණය x 100 වාර්ෂික මුළු පුනරාවර්තන වියදම				3%
7.	පවතින අධ්‍යයන කාර්යමණ්ඩල ධාරිතාව	දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100 අවශ්‍ය උපදේශක සංඛ්‍යාව				43 %
8.	අනුමත සේවක සංඛ්‍යාව මත පදනම්ව උපදේශකවරුන්ගේ ධාරිතාව	දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100 අනුමත සේවක සංඛ්‍යාව				46 %

5 වන පරිච්ඡේදය

තිරසාර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම (SDG)

ඉලක්කය අරමුණ	ඉලක්ක	ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ දර්ශක	ඉලක්ක සපුරා ගැනීම් වල ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
4.1.2	ඉලක්කය 4.4: 2030 වන විට, සමාජමය වශයෙන් වැදගත් රැකියා සහ ව්‍යවසායකත්ව සඳහා තාක්ෂණික සහ වෘත්තීය කුසලතා ඇතුළු අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටි සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම	වාර්ෂිකව සිසුන් බඳවා ගැනීම් ගණන		ලැබුණු අයදුම්පත්‍රයෙන් 70 % පමණ සිසුන් බඳවා ගෙන ඇත	
4.1.4	ඉලක්කය 4.c: 2030 වන විට, ඇතුළුව සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩි කිරීම විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල ගුරු පුහුණුව සඳහා අඩුම සංවර්ධිත රටවල් සහ කුඩා දූපත් සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් සඳහා වන ජාත්‍යන්තර සහයෝගිතාව හරහා සහයෝගය ලබා ගැනීම	ධාරිතාව ගොඩනැගීම සඳහා පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	√		
4.2.2	ඉලක්කය 4.3: 2030 වන විට, දැරිය හැකි මිලකට සහ ගුණාත්මක භාවයෙන් සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට සමාන ප්‍රවේශයක් සහිතව විශ්ව විද්‍යාලය මට්ටම දක්වා තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා දීම .	බඳවාගත් කාන්තා සිසුන් සංඛ්‍යාව	45% ක කාන්තා ශිෂ්‍ය සංඛ්‍යාවක්		
4.2.3	ඉලක්කය 4.5: 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතා ඉවත් කර සමාන ප්‍රවේශයක් ලබා දීම. සමාජයේ සියළු මට්ටම් සහිත පුද්ගලයන්ට අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව ලබා දීම (ආබාධිතයන්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි තත්වයන් වල සිටින ළමුන්)	වෘත්තීය පාඨමාලා බඳවා ගැනීම සඳහා සමාන අවස්ථා ලබා දීම ආබාධිත සිසුන් සඳහා පහසුකම් සහිත විද්‍යාල සංඛ්‍යාව ආර්ථික වශයෙන් සෞඛ්‍ය සම්පන්න නොවන පවුල් සඳහා ශිෂ්‍ය දීමනා සහ ශිෂ්‍යාධාර සංඛ්‍යාව		√	

5.1.2 තිරසාර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

ජයග්‍රහණ

• භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා අත්පත් කරගැනීම සඳහා 2021 අයවැය මගින් ප්‍රතිපාදන ලබා ගැනීම තුලින් වාර්ෂික බඳවාගන්නා සිසුන් වැඩි කිරීම සඳහා අවස්ථාව ලැබීම.

• මාර්ගගත සහ මිශ්‍ර මාදිලියේ පාඨමාලා පැවැත්වීම තුලින් Covid 19 වසංගතය අභියෝගවලට සාර්ථකව මුහුණ දීම දෙමින් පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව ලැබුනි.

• හඳුනාගත් කාර්මික පාඨමාලා වල සිසුන් සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ලබා දීම සහ සහනදායී වාර ප්‍රවේශපත්‍ර ලබා දීම තුලින් සුභසාධන පහසුකම් සැලසීම.

අභියෝග

• සමාජීය ආකල්ප නිසා වෙල්ඩින්, පෙදරේරු සහ ලී වැඩ වැනි කාර්මික පාඨමාලා සඳහා සිසුන්ගේ අඩු ආකර්ෂණය.

• වෘත්තීය හා කාර්මික පාඨමාලා සඳහා කාන්තා සිසුන්ගේ සහභාගීත්වය සාපේක්ෂව අඩු වීම.

• විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පුහුණුව ලබා දීම විශේෂ පාඨමාලා සැලසුම් කර නොතිබීම හා ඒ සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් වල නොමැතිවීම.

• අධ්‍යයන අංශයේ හඳුනාගත් අංශවල (ඉහල ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර) අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු නොපිරවීම කාර්මික අධ්‍යාපනයේ ගුණාත්මක භාවයට සෘජු බලපෑමක් ඇතිකර ඇත.

• නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි තාක්ෂණයට මුහුණ දීම සඳහා උපදේශකවරුන් යාවත්කාලීන නොවීම.

6 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යාව කළමනාකරණය

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජේෂ්ඨ	1315	586	727
තෘතීතික	144	55	89
ද්විතීක මට්ටම	1193	887	385
ප්‍රාථමික	1174	798	372

6.1.1 2021.12.31 දිනට සේවක පුරප්පාඩු

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	%
අධ්‍යයන	1345	676	669	50
අනධ්‍යයන	2525	1740	785	31

6.1.2 කාර්ය සාධනය මත අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වල බලපෑම

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 50% පමණ වන අතර,මේ වන විට බාහිර උපදේශයකවරුන් යොදා ගනිමින් පුහුණු පාඨමාලා පවත්වාගෙන යන අතර, කාර්මික අධ්‍යාපනය හා පුහුණුව මඟින් වඩාත් වෘත්තීය රැකියා අවස්ථා වෙත යොමු කර හැකි පාඨමාලාවලට අදාල වන ගුරු පුරප්පාඩු 135 ක් පිරවීම ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇති අතර, මෙමඟින් කාර්මික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට සෘජු බලපෑමක් ඇති කල හැක.

6.2 මානව සම්පත් සංවර්ධන කාර්ය සාධනය

උද්ගත වූ කෝවිඩ් තත්වය හමුවේ සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් සියල්ල පැවැත්වීමට අපහසු විය. මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශීය පුහුණු වැඩසටහන් බහුතර යක් පවත්වන ලදී.

6.2.1 **2021** වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

	වැඩසටහන	පුහුණුව ලැබූ කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	මුළු ආයෝජනය (රු)		වැඩසටහන් ස්වභාවය (දේශීය/ විදේශීය)	ප්‍රතිඵලය
				දේශීය	විදේශීය		
1	මෝටර් රථ කාර්මික ශෘත්තිකයන් පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම	2	2021.08.23 to 2021.08.27			දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
2	වායු සමීකරණ සහ ශීතකරණ (HVAC) පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම.	2	2021.08.30 to 2021.09.03	මාර්ගගත ක්‍රමය		දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
3	මෝටර් රථ අංශයේ පුහුණුකරුවන් සඳහා නව තාක්ෂණික කාර්මික නිරාවරණය. (මෝටර් රථ විදුලි සහ මෝටර් රථ යාන්ත්‍ර විද්‍යාව.)	සියළු විද්‍යාල	2021.09.14	මාර්ගගත ක්‍රමය		දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
4	මෝටර් රථ අංශයේ පුහුණුකරුවන් සඳහා නව තාක්ෂණික දියුණුව.	සියළු විද්‍යාල	2021.09.22 to 2021.09.25	මාර්ගගත ක්‍රමය		දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
5	ශීතකරණ සහ වායු සමීකරණ අංශය සඳහා නව තාක්ෂණික දියුණුව (2 වන පුහුණු සැසිය).	සියළු විද්‍යාල	2021.09.29 to 2021.10.02	මාර්ගගත ක්‍රමය		දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
6	කර්මාන්ත – ආයතන නියුක්ත වීම සහ අධ්‍යාපනඥයින් මාර්ගගත සමුළුව (I2Es) 2021.(තොරතුරු තාක්ෂණය සහ ඉලෙක්ට්‍රොනික)	3	2021.10.27 to 2021.10.28	මාර්ගගත ක්‍රමය		දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
7	සංවර්ධනය වෙමින් පවතින රටවල TVET ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණය.	2	2021.11.03 to 2021.11.16	මාර්ගගත ක්‍රමය		දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
8	වායු සමීකරණ සහ ශීතකරණ පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම.	10	2021.12.06 to 2021.12.09	මාර්ගගත ක්‍රමය		දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
9	ප්‍රධාන කාර්යාලයේ ඉන්ටෙන්ටරි හැසිරවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්	30	2021.04.28			දේශීය	ධාරිතා වර්ධනය
10	ප්‍රධාන කාර්යාලයේ ගොනු කළමනාකරණ පද්ධති සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්. (1 වන කණ්ඩායම)	30	2021.04.29	රු 5,100.00		දේශීය	ධාරිතා වර්ධනය
11	ප්‍රධාන කාර්යාලයේ ගොනු කළමනාකරණ පද්ධති සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්. (2 වන කණ්ඩායම)	30	2021.04.30	රු.4,400.00		දේශීය	ධාරිතා වර්ධනය
12	විදුලි වෙළඳාම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම.	9	2021.07.28 to 2021.08.01				ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
13	COT/TC හි ප්‍රධානීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන.	55	2021.11.19	රු.40,520.00		දේශීය	ධාරිතා වර්ධනය
14	ප්‍රධාන කාර්යාලයේ ගොනු කළමනාකරණ පද්ධති සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්. (3 වන කණ්ඩායම)	30	2021.11.25	රු.4,841.00		දේශීය	ධාරිතා වර්ධනය
15	ALUMEX (වරකාපොල TC යටතේ සම්බන්ධීකරණය කරන ලද) සහයෝගීතාවයෙන් ඇලුමීනියම් වෙළඳාමේ උපදේශක නංවාලීමේ වැඩසටහන	12	2021.11.27/ 2021.11.28			දේශීය	ක්ෂේත්‍රයේ කුසලතා වාර්ධනය
16	පරිපාලන අංශයේ නිලධාරීන් සඳහා පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා විශ්‍රාම වැටුප් සකස් කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන	30-35	දින 05	රු.51,650.00		දේශීය	පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා විශ්‍රාම වැටුප් සකස් කිරීම.
17	නවක කළමණාකරණ සේවා නිලධාරීන් හා නවක සංවර්ධන නිලධාරීන් සඳහා මූලික පුහුණු වැඩසටහන	30-35	දින 05	රු.59,315.00		දේශීය	රාජ්‍ය සේවයේහි රාජකාරී පිළිබඳ මූලික පුහුණුව
18	තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන්හි ශාස්ත්‍රපති උපාධිය හදාරනු ලබන නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම	61		රු.6,408,050.00		දේශීය	

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)		අදාල නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්		අදාල නොවේ.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්		අදාල නොවේ.	
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2018/267 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	ආයතනය තුල මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	අංක 204/171 දරණ 2014.05.11 දිනැති චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී එය ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු (2) 134.රේ.DMA -1/2019අනුව , වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාක්ච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		

6.3	අංක 2018 හි (4) 40දරණ පනතේ උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
6.4	මු.රේ.134(3)ට අනුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA 1-2019 චක්‍රලේඛය අනුව වර්ෂය තුල අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පවත්වා තිබීම.	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ ලිපි අංක DMA/AMC/M/2020/5-4 මගින් විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පැවැත්වීම (කොවිඩ් වසංගත තත්වය හේතුවෙන්)		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 2017/01 හි 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ලේඛනය ප්‍රකාරව එහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සුදුසු නිලධාරියකු පත් කර ඒ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 ට අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ අදාල කාලය තුල සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	භාණ්ඩ අපහරණය කිරීම මු.රේ 177.අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරනය කර තිබීම	අනුකූල වේ.		

9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රේ.103,104,109,110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	අංක 2016/30 දරණ 2016.12.29 දිනැති ලේඛනයේ 3.1 පරිච්ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාව සම්පූර්ණ වාහන වල ලොග් පොත් වල අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම		අදාල නොවේ	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රේ.94(1) ප්‍රකාරව උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟ ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ..මු.රේ. 571ප්‍රකාරව කටයුතු කර තිබීම.	.	අදාල නොවේ	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රේ. 371.ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මුරේ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග සැසඳීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසුගෙවීම් සිදුකොට තිබීම		අදාල නොවේ	
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රේ.176 අනුව නිහ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	අංක2017.09.20 හා 04/2017 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එනි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ඒ තුලින් මහජනයාගේ ප්‍රශංසා හා චෝදනා පල කිරිමට ද පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 8 හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වතාවක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	කළමණාකරන අමාත්‍යාංශ චක්‍ර ලේඛ අංක 05/2018 (1) අනුව පුරවැසි ප්‍රඥප්තියයක් සේවාලාභීන්ට සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම .	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව සේවාලාභී පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම් කටයුතු හා ක්‍රියාත්මක කිරීම/ඇගයීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදයක් ආයතනය විසින්ම සකස්කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**	.		
19.1	රාජ්‍ය පරිපාලන අංක 2018/02 හා 2018.01.24 දිනැති චක්‍ර ලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

අවසානය